# තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවීම

1.0 තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යාල කාර්ය සහායක තනතුරේ දැනට පවත්නා පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම වසරක කාලයකට නිලධරයන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව 2018.10.02 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ දැනට පවතින තාවකාලික ගණයේ කොන්ත්‍රාත් පදනම මත වන පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම නොපිරවීමට තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් තීරණය කරනු ඇත.

4.0 වැටුප :- කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/0052 හා 2016.07.18 දිනැති ලිපිය අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 උපලේඛන II පදනම්ව අදාල වැටුප් තලය මසකට රු. 19,242 + 4,998 + 7800 කි.

5.0 සුදුසුකම්:- කොන්ත්‍රාත් පදනම මත කාර්යාල කාර්ය සහායක තනතුරු වලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ආ) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ඇ) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

(ඈ) අධ්‍යාපන සුදුසුකම්
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත්ව තිබීම.

(ඉ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි v වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **අයදුම්පත් කැඳවන දිනයේ** හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේදීම පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කාර්යාල කාර්ය සහායක තනතුරු වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම වසරක කාලයකට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| නිර්ණායක | | ලකුණු |
|---|---|---|
| තනතුරට ලබා ඇති පළපුරුද්ද ( සහතික මගින් සනාථ විය යුතුය.) එක් වසරකට ලකුණු 02 බැගින් උපරිම වසර 5ක් සඳහා සලකා බලනු ලැබේ.) | | 10 |
| සන්නිවේදන හැකියාව | | 5 |
| අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස. උසස් පෙළ සමත්ව තිබීම | 5 |
| | අ.පො.ස. (සාමාන්‍ය) පෙළ විභාගයේදී ගණිතය, භාෂාව, දෙවැනි රාජ්‍ය භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ වෙනත් භාෂා සඳහා සාමාර්ථයක් ලබා තිබීම ( එක් භාෂාවක් සඳහා ලකුණු 2 බැගින් උපරිම විෂයයන් 5ක් සලකා බලනු ලැබේ.) | 10 |
| පෞරුෂය | | 5 |
| බාහිර ක්‍රියාකාරකම් (ක්‍රීඩා / සමාජ සේවා....... යනාදී) | | 5 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | | 10 |
| මුළු ලකුණු | | **50** |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

7.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

8.0 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රයය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

8.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම** " යන්න සඳහන් කරන්න.

09.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත්, ඒ සම්බන්ධව තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී.එච්.ආනන්ද
අතිරේක ලේකම් (පාලන)

අත්/කළේ : ඒ.පී.ජී. කිත්සිරි
ලේකම්
තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය
සංවර්ධන අමාත්‍යාංශය

2018 සැප්තැම්බර් මස මස ...12.....දින
තිරසර සංවර්ධන, වනජීවී සහ
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
අංක 1090,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය